# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,051 - 2017 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2017.12.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 176 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 177 |


*සැ. යු.* - වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත 2017 දෙසැම්බර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජනවාරි මස 12 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 දෙසැම්බර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


175 - B 81236 - 353 (2017/12)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

ඇමුණුම 9.

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

දකුණු පළාත් සභාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ, කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කොමසාරිස් (අන්තර් පළාත්) ඉන්දික සම්පත් සමරකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.06.26 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගා/ප්‍ර 4896 එල්එල් 5480 දරන ප්‍රධාන පත්‍රයේ හිමිකරු වන ගලගාවවෙල පදිංචි කළුවා දේව සමලින් වෙත ප්‍රදානය කොට බලපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 311 යටතේ 1986.06.26 වැනි දින ලියාපදිංචි කරනු ලැබී ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2017.12.29 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ කරන්දෙණිය ප්‍රාදේය ලේකම් කොට්ඨාසයේ 95 බී පෙහෙඩියකන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගලගාවවෙල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද ගාල්ල මැනුම් අධිකාරි විසින් සම්පාදිත මු. පි. ගා. 102 හා අංක මු. පි. ගා. 102 දරන රේඛා සටහනේ අංක 54 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දෙකක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : පෙහෙඩියකන්ද වත්ත,

| | | |
|---|---|---|
| උතුරට | : | මෙම සැලැස්මේ කැබලි අංක 54 හා 55; |
| නැගෙනහිරට | : | මෙම සැලැස්මේ කැබලි අංක 55 ; |
| දකුණට | : | මෙම සැලැස්මේ කැබලි අංක 52, 67 හා 68 ; |
| බස්නාහිරට | : | මෙම සැලැස්මේ කැබලි අංක 52. |

අයි. එස්. සමරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
කරන්දෙණිය.

2017 අගෝස්තු මස 25 වැනි දින.

12-530

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.**

ඌව පළාත් සභාවේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කසුන් එස්.කේ. වැල්ලහේවා වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986 අප්‍රේල් මස 01 වැනි දින ප්‍රදනය කර ඇති අංක මො/ප්‍ර 2576 දරන ප්‍රදන පත්‍රයේ හිමිකරු වන බඩල්කුඹුර, පරළුකැටිය පදිංචි ලිදේපිටියේ සිංඤ්ඤෝ වෙත ප්‍රදනය කොට මොනරාගල දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ අංක LDO/2/268 යටතේ 1987.04.10 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකුලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.01.29 වැනි දිනට පෙර මාවෙත ලිඛිතව දනුම්දිය යුතුය.

උපලේඛනය

ඌව පළාතේ මොනරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුකර කෝරළේ වාසිපන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අළුපොත නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, මොනරාගල මැනුම් අධිකාරි විසින් සම්පාදිත අංක - දරන කට්ට කැඩීමේ පිඹුරේ අ.ග.පි. 210 හි අංක 164 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.474 අක්කර - රූඩ් - පර්චස් - විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම,

| | | |
|---|---|---|
| *උතුරට* | : | 172 දරන බිම් කැබැල්ලෙන් කොටසක් හා 111 දරන බිම් කැබැල්ල; |
| *නැගෙනහිරට* | : | 172 දරන බිම් කැබැල්ලෙන් කොටසක්; |
| *දකුණට* | : | 172 දරන බිම් කැබැල්ලෙන් කොටසක්; |
| *බස්නාහිරට* | : | 172 දරන බිම් කැබැල්ලෙන් කොටසක්. |

කසුන් එස්. කේ. වැල්ලහේවා,
ප්‍රාදේශීය ලේකම්,
බඩල්කුඹුර.

2017 අගෝස්තු මස 11 වැනි දින.

12-525

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/49380 .
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්සීපී/පීඑල්සී/එල්7/10/4.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 314 සාලියපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, සාලියපුර ගමේ වා. මැ. මු. පි. 35 පිඹුරේ කැබලි අංක 97 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.456 පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා මංජුසා නන්දනී සෝමපාල මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ : -

*උතුරට* : කැබැලි අංක 96 හා 67 ;
*නැගෙනහිරට* : කැබලි අංක 67 හා 56 ;
*දකුණට* : කැබැලි අංක 56 හා 63 ;
*බටහිරට* : කැබලි අංක 63 හා 96.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2017.08.02 සිට ඉදිරියට);

(ආ) *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2017 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ මුදලින් 50% කට නොවැඩි විය යුතු ය.

*වාර මුදල*.- ඉඩමේ වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි ;

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඈ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම අඹ වගා ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2017.08.02 වැනි දින සිට වසර 05ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2017 ක් වූ දෙසැම්බර් මස 22 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි ,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-630

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/51752.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : PLC/L2/LP/3.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ලස්සකන්ද 161 සී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ විතාරම්පංගුව ගමේ අ. ග. පි. 395 අංක PLC/L/4/SUR/2015/12-231 දරන අනුරේඛනයේ කැබලි අංක X, Z, AF, AE ප්‍රමාණයෙන් පර්. 20.25ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා එරත්න පවර් කම්පැනි (පුද්.) සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

කැබලි අංක X (හෙක්. 0.0055)
*උතුරට* : කැබලි අංක 300 ;
*නැගෙනහිරට* : කැබලි අංක 300 සහ කොටස W ;

*දකුණට* : කොටස W කැබලි අංක 299 සහ කොටස Y ;
*බටහිරට* : කොටස Y.

කැබලි අංක Z (හෙක්. 0.0352)
*උතුරට* : කැබලි අංක 300 ;
*නැගෙනහිරට* : කැබලි අංක 300, කොටස X සහ කොටස Y ;
*දකුණට* : කොටස Y කැබලි අංක 299 සහ 300 ;
*බටහිරට* : කැබලි අංක 300 සහ කොටස AA.

කැබලි අංක AF (හෙක්. 0.0025)
*උතුරට* : කැබලි අංක 300 ;
*නැගෙනහිරට* : කැබලි අංක 300 ;
*දකුණට* : කැබලි අංක 303 සහ කොටස AG ;
*බටහිරට* : කොටස AD.

කැබලි අංක AE (හෙක්. 0.0080)
*උතුරට* : කොටස AC සහ AD ;
*නැගෙනහිරට* : කොටස AD ;
*දකුණට* : කොටස AD, කැබලි අංක 305 සහ 300 ;
*බටහිරට* : කැබලි අංක 300.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2017.06.12 දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු පහකට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතු ය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ ;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2017.06.12 වැනි දින සිට වසර 05ක් ගත වන තුරු පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් පත්‍රයේ පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. එරන්තිකා ඩබ්. කුලරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-631

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/53892.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්සීපී/පීඑල්සී/එල්2/15/04.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 281, උළුක්කුලම ග්‍රාම නිලධාරි වසමේ දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 15.4 ක් වූ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා බාලචන්ද්‍ර

ආරච්චිගේ දොන් නුවන් චතුරංග පද්මසිරි විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් ෘ -

*උතුරට* : පුත්තලම-අනුරාධපුර ප්‍රධාන පාර රක්ෂිතය;
*නැගෙනහිරට* : වැව රක්ෂිතය ;
*දකුණට* : වැව රක්ෂිතය ;
*බටහිරට* : කේ. බී. මහින්දපාලගේ ඉඩම

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ ෲ-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2017.11.14 දින සිට ඉදිරියට) ;

***වාර්ෂික බදු මුදල*** .- 2017 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2% කි. 2017 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ බදු මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

*වාර මුදල*.- අය නොකෙරේ ;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2017.11.14 වැනි දින සිට වසර පහක් ගතවන තුරු මෙම ඉඩම බදු ගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුර බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි ,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12 - 535

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය ෘ 4/10/48999.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය ෘ EP/28/LB/LS/BAT/KPN/29

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 211සී, පනිච්චන්කර්නි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පනිච්චන්කර්නි ගමේ TOPO PP 42 පිඹුරේ කැබලි අංක 3323 සහ 3324 දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර 6.069 ක් පමණ වූ ඉඩම් කැබැල්ලක් කැෂ් කැපිටල් රිසෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් ෘ -

කැබලි අංක 3323

*උතුරට* : කැබලි අංක 3322 සහ 979 ;
*නැගෙනහිරට* : කැබලි අංක 3326 ;
*දකුණට* : කැබලි අංක 3324 ;
*බටහිරට* : කැබලි අංක 3325 සහ 3322.

කැබලි අංක 3324

*උතුරට* : කැබලි අංක 3323 ;
*නැගෙනහිරට* : කැබලි අංක 3326 ;
*දකුණට* : කැබලි අංක 3326 ;
*බටහිරට* : කැබලි අංක 3325.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ) බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2017.11.08 සිට 2047.11.07 දක්වා) ;

*වාර්ෂික බදු මුදල* .- බද්ද ක්‍රියාත්මකවන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ ;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඊ)* 2017.11.08 වැනි දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදු ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුර බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*(ඌ)* සෑදූ ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතුය.

මෙම නිවේදය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එල්.පී. චාමිකා සුබෝධිනී,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි ,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12 - 534

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/49368.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
පළාත්/ඉකො/ඉ9/ආර්/දි. බ. 03.

### අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 591/බී විජයකටුපොත ඇලෙන් මෙගොඩ ග්‍රාම නිලධාරී වසමේ, විජයකටුපොත ගමේ මු. පි. මු. 4921 දරන සැලැස්මෙහි කැබලි අංක 13 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0192 ක් වූ රජයේ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා සී/ස විජයකටුපොත සණස සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | 12 වැනි බිම් කැබැල්ල ; |
| *නැගෙනහිරට* | : | 4073 මුලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ල ; |
| *දකුණට* | : | 14 වැනි බිම් කැබැල්ල ; |
| *බටහිරට* | : | 12 වැනි බිම් කැබැල්ල. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2017.10.20 සිට 2047.10.19 දක්වා) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2017 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි.

*වාර මුදල*.- නැත ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2017.10.20 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ ;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වයි. වයි. එන්. පෙරේරා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
1200/6 හි , ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර''
රජමල්වත්ත පාර, බත්තරමුල්ලෙ හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-749

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/40675.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
පළාත්/ඉකො/ඉ6/නව/දි.බ. සමුපකාර.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 644/3, මියැල්ලෑව ග්‍රාම නිලධාරි වසමේ අ. ග. පි. 3402 දරන සැලැස්මෙහි කැබලි අංක 86 හි දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.244ක් වූ රජයේ ඉඩම් කොටස සමිති ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා සී/ස නවගත්තේගම විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ : -

*උතුරට* : කැබලි අංක 85 ;
*නැගෙනහිරට* : කැබලි අංක 68 ;
*දකුණට* : කැබලි අංක 87, 67 හා 84 ;
*බටහිරට* : කැබලි අංක 84.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2017.10.20 සිට 2047.10.19 දක්වා).

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2017 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි.

වාර මුදල .- නැත;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) ප්‍රාදේශීය ලේකම්ගේ සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

( උ) 2017.10.20 දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ ;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළවූ දින සිට සති 6ක් ඇතුළත දී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වයි. වයි. එන්. පෙරේරා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
1200/6 හි ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-750

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/40964.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NP/28/04/2/SLO/Cashew/(Cheddi).

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

වවුනියාව දිස්ත්‍රික්කයේ, වෙංගලසෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිරමනාලන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පිරමනාලන්කුලම් ගමේ පිහිටි අනුරේඛන අංක LP/1181E/1518 දරන ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද අනුරේඛනයේ කැබලි අංක 153, 152 දරන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් අක්කර 13 පර්චස් 12.41 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා ආතර් කිවින්ටින් කුමාරදාස ජයමහ මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | අනුරේඛන අංක LP/1181E/1518 හි කැබලි අංක 133 සහ 134 ; |
| *නැගෙනහිරට* | : | අනුරේඛන අංක LP/1181E/1518 හි කැබලි අංක 152 හි කොටසක් ; |
| *දකුණට* | : | පාර ; |
| *බටහිරට* | : | පාර. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2017.09.25 දින සිට) ;

(ආ) *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2017 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50% කට නොවැඩි විය යුතු ය.

*වාර මුදල*.- වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි ;

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඊ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(ඌ) අවුරුදු 05 ක අවම කාලයක් ඉකුත් වීමට කලින් අතුරු බදුදීම් කළ නොහැක ;

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. එරන්තිකා ඩබ්. කුලරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි ,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-748

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.